**ශීර්ෂය 326 - ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව**

**--------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනයකළ මතය

ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 ජුනි 07 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුනි 04 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශනය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන්  වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ  අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂ සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂ සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කළ යුතුව තිබුණි. එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථාවක් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 7(**ii**), “මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා මග පෙන්වීම” ඡේදය අනුව ආදායම් ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන් ආදායම් එකතු කරනු ලබන වෙනත් අමාත්‍යාංශ එම ආදායම් තම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ භාණ්ඩාගාරයෙන් ලද අක් මුදල් ලෙස සලකා ඒසීඒ-3 ආකෘතියේ ඇතුලත් කළ යුතු වුවත් ආදායම් ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන් එසේ එකතු කර තිබූ රු.10,595,473 ක් 2018 වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ බදු නොවන ආදායම් හා වෙනත් ආදායම් ලැබීම් යටතේ ඒසීඒ-1 ආකෘතියේ දක්වා තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ උපදෙස් පිළිපැදිය යුතුවේ. | 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී නියමිත ආකෘතියට ඇතුලත් කිරීමට කටයුතු කරමි. |

### 1.6.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| <u>නීති,රීති හා රෙගුලාසි වලට යොමුව</u> | <u>අනුකූල නොවීම</u> | | |
| **රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ** | | | |

| | | | |
|---|---|---|---|
| 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන චක්‍රලේඛයේ 3.2 ඡේදය | 2017 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත්කර තිබුණ ද භාණ්ඩ සමීක්ෂණය සිදු කර නොතිබූ අතර 2016 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය අනුව වූ නිර්දේශ 2019 මැයි 19 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. | 05/2016 රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ උපදෙස් පිළිපැදිය යුතුවේ. | කඩිනමින් අවශ්‍ය කටයුතු සිදු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1. වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) පුනරාවර්තන වැය විෂයයන් 05 ක් සඳහා වෙන් කර තිබූ රු.මිලියන 10.76 ක ප්‍රතිපාදනවලින් සියයට 15 කට වැඩියෙන් එනම් රු. මිලියන 1.68 ක් ඉතිරිව තිබූ අතර එම එක් එක් වැය විෂයයන්හි ඉතිරිවීම් ප්‍රතිශතය සියයට 11 සිට සියයට 49 ක් දක්වා පරාසයක පැවතුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කල යුතුවේ. | අපේක්ෂිත පරිදි වියදම් නොයෙදීම නිසා ප්‍රතිපාදන ඉතිරි විය. |
| (ආ) මූලධන වැය විෂයයන් 05 ක් සඳහා වෙන්කර තිබූ රු.මිලියන 10.44 ක ප්‍රතිපාදනවලින් සියයට 35 ක් එනම් රු.මිලියන 3.66 ක් ඉතිරිව තිබූ අතර එම එක් එක් වැය විෂයයන්හි ඉතිරිවීම් ප්‍රතිශතය සියයට 20 සිට සියයට 78 දක්වා පරාසයක පැවතුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කල යුතුවේ. | ඉදිකිරීම් ඇස්තමේන්තු පැරණි වීම, අළුත්වැඩියාවට කාලය ප්‍රමාණවත් නොවීම, අපේක්ෂිත පරිදි වියදම් නොයෙදීම හා අක්මුදල් නොලැබීම ඉතිරිවීමට හේතු විය. |
| (ඇ) මුදල් රෙගුලාසි 66 අනුව මාරුකිරීම් මගින් වැය විෂය 2102 සඳහා ලබා ගත් රු.මිලියන 1.44 ක සම්පූර්ණ ප්‍රතිපාදනයම උපයෝජනය කර නොතිබුණි. | මාරුකිරීම් මගින් ලබා ගත් ප්‍රතිපාදන උපයෝජනය කළ යුතු වේ. | අක්මුදල් නොලැබීම මත ප්‍රතිපාදන ඉතිරි විය. |

### 2.2. අත්තිකාරම් ගිණුම් ශේෂ

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|

| | | |
|---|---|---|
| වැඩ තහනම් කළ නිලධාරියෙකුගේ 2018 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.131,020 ක ණය ශේෂයට වර්ෂ 07 කට වැඩි කාල පරාසයක් ගත වී තිබුණ ද විනය පරීක්ෂණ කටයුතු කඩිනමින් අවසන් කර එම ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | විනය පරීක්ෂණ කටයුතු කඩිනමින් අවසන් කර ණය ආපසු අයකර ගත යුතු වීම. | විනය පරීක්ෂණ කටයුතු අවසන් වූ වහාම අයකර ගැනීමට කටයුතු කරමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| <u>විගණන නිරීක්ෂණය</u> | <u>නිර්දේශය</u> | <u>ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම</u> |
|---|---|---|
| (අ) කොළඹ දිස්ත්‍රික් ප්‍රජා විශෝධන කාර්යාල සඳහා අනුබද්ධ කර ඇති කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 13 අතුරින් කාර්යාල 07 ක සංවර්ධන නිලධාරීන් (ප්‍රජා විශෝධන) නොමැති වීම හේතුවෙන් ප්‍රජා විශෝධන ආඥාලාභීන් නැවත නැවත ප්‍රජා විශෝධන ආඥාවලට ලක් වීම වැලැක්වීමට අවශ්‍ය වැඩ සටහන් සකස් කිරීම, එකී වැඩසටහන් දියත් කිරීම, පවුල් සංවර්ධන සැලසුම් සකස් කිරීම හා පසුවිපරම් කටයුතු ඵලදායී ලෙස ඉටුකිරීම වැනි කටයුතු විධිමත් පරිදි ඉටු වී නොතිබුණි. | ඉහළ කළමනාකරණය විසින් අදාල ආයතන සමග සම්බන්ධ වී පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කල යුතුවේ. | නිලධාරී පුරප්පාඩු හේතුවෙන් මෙම තත්ත්වය ඇති වී ඇති අතර ඒ පිළිබඳව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා දැනුවත් කර ඇත. |
| (ආ) ආඥාලාභීන් විශෝධන ක්‍රියාවලියෙන් අනතුරුව නැවත ඇතුලත්වනුයේ තමා ජීවත් වන සුපුරුදු පරිසරය තුළට වීම හේතුවෙන් ආඥාලාභීයා නැවත වරදට පෙළඹීම වලක්වා ගැනීම සඳහා ආඥාලාභීන් සඳහා ආගමික උපදේශන හා සමගාමීව පුද්ගලික උපදේශන ඔවුන්ගේ අවදානම් මට්ටම අනුව ලබා දිය යුතු වුවත් ඒ සඳහා ප්‍රජා විශෝධන කාර්යාල තුළ අවශ්‍ය පරිසරය හා ඉඩකඩ නොපැවතුණි. | අධිකරණ කලාප කිහිපයක් හෝ ආවරනය වන පරිදි මධ්‍යස්ථානයක් ඉදිකර ගැනීමට ඉහළ කළමනාකරණය පියවර ගැනීම උචිතය. | අවශ්‍ය පරිසරය හා ඉඩකඩ නොමැත. |
| (ඇ) සමාලෝචිත වර්ෂයට ආඥාලාභීන් | අනුමත සැලසුම්ගත ඉලක්ක | ආඥාලාභීන් ශ්‍රමදාන |

| | | |
|---|---|---|
| සඳහා වෘත්තීය පුහුණු වැඩසටහන් 399 ක් සහ ගෙවීම් නොකරන ප්‍රජා වැඩ හා ශ්‍රමදාන වැඩසටහන් 893 ක් සැලසුම් කර තිබුණ ද සත්‍ය වශයෙන් ක්‍රියාත්මක කර තිබුණේ පිළිවෙලින් වැඩසටහන් 292 ක් හා 792 ක් පමණි. | සපුරා ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුවේ. | වැඩසටහන් සඳහා යෙදවිය හැක්කේ ප්‍රජා වැඩ වෙනුවෙන් වන අතර ප්‍රජා වැඩ සඳහා යෙදවීමට වඩා විශෝධන කාර්යය කෙරෙහි වර්තමානයේ වැඩි අවධානය යොමු කිරීමට කටයුතු කරනු ලැබේ. |

**3.2 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| <u>විගණන නිරීක්ෂණය</u> | <u>නිර්දේශය</u> | <u>ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම</u> |
|---|---|---|
| කුරුණෑගල දිස්ත්‍රික් ප්‍රජා විශෝධන මධ්‍යස්ථානය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කටයුතු 2012 දෙසැම්බර් 14 දින ආරම්භ කර තිබුණ ද ඒ සඳහා ඉඩම විධිමත් පරිදි පවරා නොගැනීම හා විධිමත් ස්ථානීය පරීක්ෂණයක් සිදු කර සුදුසු ඉඩමක් තෝරාගැනීමට කටයුතු කර නොතිබීම වැනි කරුණු හේතුවෙන් ඉදිකිරීම් අතරමග නතර කර තිබුණි. 2019 මැයි 25 දිනටත් මේ සම්බන්ධව වෙනත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබීමෙන් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබූ රු.231,575 ක මුදල නිෂ්කාර්ය වියදමක් බවට පත් වී තිබුණි. | ඉහළ කළමනාකරණය විසින් විධිමත්ව පරිපාලන තීරණ ගත යුතුවේ. | මෙම ඉඩමේ ප්‍රජා විශෝධන මධ්‍යස්ථානයක් ඉදිකිරීමෙන් අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට නොහැකි තත්ත්වයක් ඇති විය හැකි බැවින් හා 2015 වර්ෂය අග භාගයේ දී දෙපාර්තමේන්තුව අමාත්‍යාංශ දෙකක් යටතට වරින්වර පත්වූ බැවින් ඉදිරි කටයුතු සිදු වී නොමැත. |

**3.3 කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| <u>විගණන නිරීක්ෂණය</u> | <u>නිර්දේශය</u> | <u>ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම</u> |
|---|---|---|
| (අ) ආඥාලාභීන් සඳහා උපදේශන, ආගමික හා අධ්‍යාත්මික වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී එක් අවස්ථාවකදී ආඥාලාභීන් සමූහයක් විශෝධනය කිරීමට ප්‍රමාණවත් පහසුකම් හා ඊට යෝග්‍ය මධ්‍යස්ථාන නොමැතිවීමෙන් විශෝධන නිලධාරීන් හට එම කාර්යය කරගෙන යාමේ දී විවිධ ගැටලුවලට මුහුණ දීමට සිදු වී තිබුණි. | ආයතනයේ අරමුණු ඉටුකර ගැනීම කළමනාකරණයේ වගකීමක් වන හෙයින් විශෝධන කාර්යය වඩාත් කාර්යක්ෂමව හා ඵලදායීව ක්‍රියාත්මක කිරීමට අවම වශයෙන් දිස්ත්‍රික් මට්ටමින් හෝ එක් විශෝධන මධ්‍යස්ථානයක් ස්ථාපිත | ප්‍රජා විශෝධන කාර්යාල සඳහා වෙන් කළ යුතු වන ඉඩ ප්‍රමාණයන් පිළිබඳ දළ සැලැස්මක් අධිකරණ අමාත්‍යාංශයට ලබා දීමට කටයුතු කරන අතර සාමූහික උපදේශන සඳහා වෙනම මධ්‍යස්ථානයක අවශ්‍යතාවය දැඩිව පවතී. |

| | | |
|---|---|---|
| | කිරීමේ හැකියාව සොයා බැලීම. | |
| (ආ) ප්‍රජා විශෝධන ආඥාලාභීන් බොහොමයක් මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදිකරුවන් වූ අතර එම ආඥාලාභීන් විශෝධනය කිරීමට අවශ්‍ය ප්‍රතිකාර සඳහා යොමු කිරීම් සිදු කලද අදාල ප්‍රතිකාර මධ්‍යස්ථානවල ප්‍රමාණවත් ඉඩකඩ පහසුකම් නොමැති වීම මත ආඥාලාභීන්ට ප්‍රතිකාර ලබා ගැනීමට කාලයක් රැඳීසිටීමට සිදුව තිබුණි. මේ හේතුවෙන් විශෝධන ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ ගැටළු මතු වී තිබූ අතර ආඥාලාභීන් නැවත මත්ද්‍රව්‍ය සඳහා යොමුවීම තුළින් ආඥා කඩවීම් සිදු වී තිබුණු අවස්ථා පැවතියද ඒ සඳහා පිළියම් යොදා නොතිබුණි. | - එම - | නිරීක්ෂණය පිළිගන්නා අතර මත් ප්‍රතිකාර මධ්‍යස්ථානවල ඉඩකඩ ප්‍රමාණවත් නොවීම නිසා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා සමග සාකච්ඡා කර ඌන උපයෝජිත රෝහල් ප්‍රතිකාර මධ්‍යස්ථාන ලෙස ලබා ගැනීමට අවධානය යොමු වී ඇත. |

## 4. යහපාලනය

### 4.1 මහජනයා වෙත සේවා ඉටු කිරිම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රාජ්‍ය ආයතන විසින් මහජනතාව වෙත සහ වෙනත් පාර්ශවයන් වෙත තොරතුරු ලබා දීමට අවශ්‍ය වන හෙයින් ප්‍රජාපාදක විශෝධන දෙපාර්තමේන්තුව විසින් ඒ සඳහා වෙබ් අඩවිය නිර්මාණය කිරීමට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත 2013 අප්‍රේල් 17 දින රු.284,700 ක මුදලක් ගෙවා මේ වන විට වර්ෂ 06 කට අධික කාලයක් ගත වී තිබුණි. 2019 මැයි 31 දින වන විට වෙබ් අඩවියේ ඉංග්‍රීසි භාෂාවේ මූලික සැලැස්ම නිර්මාණය කර තිබූ අතර එහි කටයුතු අවසන්ව නොතිබුණි. මේ සම්බන්ධව ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සමග ගිවිසුමකට එළඹීමට ද කටයුතු කර නොතිබුණි. | විධිවිධාන ප්‍රකාරව මහජනතාව වෙත තොරතුරු ලබා දීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. | සංවර්ධන පරිපාලන ආයතනය සමඟ සාකච්ඡා කර මෙම වර්ෂය අවසානයට පෙර කටයුතු අවසන් කිරීමට අවශ්‍ය පියවර ගනිමි. |

**4.2 අභ්‍යන්තර විගණනය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර නොතිබුණු අතර විගණන සැලැස්මක් ද පිළියෙල කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන අනුව අභ්‍යන්තර විගණන කටයුතු සැලසුම් කිරීම. | අභ්‍යන්තර විගණක තනතුරක් හා කාර්යය මණ්ඩලය අනුමත කර ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ඉල්ලුම් කර ඇත. |

**5. මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අමාත්‍යාංශය විසින් සහකාර කොමසාරිස් තනතුර සඳහා සමාලෝචිත වර්ෂයේ දී සම්මුඛ පරීක්ෂණ සිදු කර ඇතත් පත්වීම් ලබා දී නොතිබුණි. සංවර්ධන නිලධාරී පුරප්පාඩු පිරවීම සඳහා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ දැනුවත් කර තිබීම හා රියදුරු පුරප්පාඩු පුරවා දෙන ලෙස අමාත්‍යාංශය දැනුවත් කර තිබූ නමුත් 2018 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණ වී නොමැති කාර්යය මණ්ඩල පුරප්පාඩු අතර නියෝජ්‍ය කොමසාරිස් තනතුර, ගණකාධිකාරී තනතුර, පරිපාලන නිලධාරී තනතුර, භාෂා පරිවර්ථන තනතුර (දෙමළ) ප්‍රජා විශෝධන නිලධාරී තනතුරු 21 ක් හා සංවර්ධන නිලධාරී 56 ක් විය. මේ හේතුවෙන් රාජකාරී කටයුතු ඵලදායීව පවත්වාගෙන යාමට බාධාවන් පැවතීම, භාෂා පරිවර්ථන කටයුතු සිදු කර ගැනීමට නොහැකි වීම, විශෝධන නියෝග ලබන වැරදිකරුවන් විශෝධනය කිරීමේ ගැටළු ඇති වීම හා මත්ද්‍රව්‍ය නිවාරන වැඩසටහන් නිසි පරිදි | ඉහළ කළමනාකරණය විසින් අදාල ආයතන සමග සම්බන්ධ වී පුරප්පාඩු පියවා ගැනීමට කටයුතු කල යුතුවේ. | නිරීක්ෂණය පිළිගනිමි. |

පැවැත්වීමට නොහැකි වීම යනාදී ප්‍රජා විශෝධන ක්‍රියාවලිය විධිමත්ව පවත්වාගෙන යාම අසීරු වී තිබුණි.